**සජිත් ප්‍රේමදාස, (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
**சஜித் பிரேமதாச, (பா.உ.)**
எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்
**Sajith Premadasa, (M.P.)**
Leader of the Opposition - Parlimaent of Sri Lanka

## එක්සත් ජාතික පක්ෂයේ අභිමානවත් 79 වන සංවස්තරය

ඩී. ඇස්. සේනානායක ශ්‍රීමතාණන් එක්සත් ජාතික පක්ෂය පිහිටුවනු ලැබුවේ ඔහු ඇතුළු අනෙකුත් නායකයන් ආරම්භ කරනු ලැබූ ලංකා ජාතික සංගමයෙන් ලද පන්නරයෙනි. වර්ෂ 1919 දී පිහිටුවන ලද ලංකා ජාතික සංගමය ශ්‍රී ලංකාවට නිදහස දිනාගැනීමේ සටනට විශාල දායකත්වයක් ලබාදුන් අතර ඒ සඳහා තවදුරටත් ජාතික දේශපාලන ව්‍යාපාරයක අවශ්‍යතාවය පැන නැගීම හේතුවෙන් එම දේශපාලන නායකත්වය ලබාදීමට එක්සත් ජාතික පක්ෂය පිහිටුවනු ලැබීය. එකී එක්සත් ජාතික පක්ෂය සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හා මැලේ ආදී විවිධ ජාතීන්ට එක්ව කටයුතු කල හැකි දේශපාලන කඳවුරක් විය. ලංකා ජාතික සංගමය ලංකාවේ නිදහසට පාර පෙන්වා දුන්නේය. එක්සත් ජාතික පක්ෂය ලංකාවට නිදහස උදාකර දුන්නේය.

ශ්‍රී ලංකා නිදහස් රාජ්‍ය බිහිවීමත්, එක්සත් ජාතික පක්ෂය බිහිවීමත් යනු දෙකක් නොව එකකි.

එක්සත් ජාතික පක්ෂය ආරම්භයේ සිට අද දක්වා මාතෘ භූමියට සිදු කර ඇති සේවය අනගිභවනීයයි. අද මේ මොහොතේ දී ශ්‍රී ලංකාවේ දේශපාලනය තුල ප්‍රජාතන්ත්‍රවාදය අභියෝගයකට ලක්ව තිබේ. එම නිසා එක්සත් ජාතික පක්ෂයේ 79 වන සංවත්සරයේ දී අප සියලු දෙනාම වර්තමානයේ සිදුව ඇති දේශපාලනික වෙනස්කම් අවබෝධ කර ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු පක්ෂවල සහයෝගීතාවය තුල තම දේශපාලන අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් මේ මොහොතේ ක්‍රියා කල යුතුය.

මම එක්සත් ජාතික පක්ෂයේ 79 වැනි සංවත්සරයට හදවතින්ම සුබ පතමි.

**සජිත් ප්‍රේමදාස,**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක සහ
සමගි ජන බලවේගයේ නායක.

දුරකතන: / Telephone: / தொலைபேசி: 011 2777253 / 011 2699171
ෆැක්ස්: / Fax: / தொலைநகல்: 011 2699174
විද්‍යුත් තැපැල: / Email: / மின்னஞ்சல்: sajith_p@dialogsl.net
අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7 I இலக்கம் 30, சர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை கொழும்பு 7 I No 30, Sir Marcus Fernando Mawatha Colombo 7